(vii) තරග විභාගයෙන් සුදුසුකම් ලැබුව ද, සම්මුඛ පරීක්ෂණයේ දී හෝ ඊට පෙර, යම් අපේක්ෂකයෙකු උසස්වීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත්, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

02. වැටුප් ක්‍රමය.-

මාසික රු. 17680 - 10 x 320—11 x 365 - 15 x 450 - රු. 31,645 කි.
(රා. ප. ච. 6/2006 - (iv) අනුව MN-6 හි 12 වැනි පියවර රු. 21,245)

(තනතුරට පත්ව අවුරුදු 03ක් ඇතුළත (4 වැනි වැටුප් පියවර එළැඹීමට පෙර) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. වයස අවුරුදු 45 එළැඹීම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීමට හේතු නොවනු ඇත.)

03. වයස් සීමාව :

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු වූ ද අවුරුදු 45ට නොවැඩි වූ ද අය විය යුතුය.

(ආ) දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවන නමුත් අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

04. සුදුසුකම් :

1. බාහිර අයැදුම්කරුවන් සඳහා

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ්‍ය ව්‍යාපාර කළමණාකරණය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය යන විෂයයන්ගෙන් (I වැනි හෝ II වැනි පංතියේ විශේෂ උපාධියක් ලබාතිබීම (මේ සඳහා පිරිවැය විෂයය ඇතුළත් විය යුතුය).

හෝ

(ආ) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) හෝ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් පරීක්ෂණයෙන් සමත්ව තිබීම

හෝ

(ඇ) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) I සහ II කොටස්වල විභාගයෙන් සමත්වී තිබීම හෝ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ්‍ය ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය යන විෂයයන් එකක් සහිතව ලැබූ උපාධියක් සමග පිරිවැය ගණකාධිකරණය පිළිබඳ වසර 02ක පළපුරුද්ද ලබා තිබීම.

11. දැනටමත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටින අයදුම්කරුවන් සඳහා—

(අ) (i) ඩිපෝ මාස්ටර්, විමර්ශණ නිලධාරි, පරීක්ෂක (ප්‍රවාහන) තනතුරක් දරන්නකු වීම,

හෝ

(ii) දුම්රිය ස්ථානාධිපති, දුම්රිය නියාමක, දුම්රිය ලිපිකරු යන දුම්රිය දෙපාර්තමේන්තුවේ I වැනි පංතියේ තනතුරක අවුරුදු 10ක සේවා කාලයක් ඇති සහ පූර්වාසන්න අවුරුදු 05 සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියකු වීම,

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ්‍ය ව්‍යාපාර කළමණාකරණය, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය යන විෂයන් එකක් සහිතව ලැබූ උපාධියක් සමග දුම්රිය දෙපාර්තමේන්තුවේ සතුටුදායක වසර 05ක සේවා කාලයක් ඇති අයකුවීම.

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) ඉහත 04 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන් තරග විභාගයකට භාජනය කර, එක්-එක් විෂයයකට අවම වශයෙන් 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති අයගේ එම ලකුණු එකතුවෙන් කුසලතා අනුපිළිවෙලට ඉහළම කුසලතාවේ සිට අපේක්ෂකයින් අවශ්‍ය සංඛ්‍යාවක් ප්‍රවාහන ලේකම්ගේ අනුමැතියෙන් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂාකර, සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ලබා ඇති අපේක්ෂකයින් තිදෙනකු තෝරා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

(ආ) තරග විභාග පරිපාටිය හා විෂය නිර්දේශය පහත දැක්වෙන පරිදි වේ. :—

| | | | |
|---|---|---|---|
| (i) | බුද්ධි පරීක්ෂණය | කාලය පැය 1 යි | මුළු ලකුණු 100 යි. |
| (ii) | පොදු ප්‍රශ්න පත්‍රය | කාලය පැය 2 යි | මුළු ලකුණු 100 යි. |
| (iii) | පිරිවැය හා සංඛ්‍යානය | කාලය පැය 3 යි | මුළු ලකුණු 100 යි. |

සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.

*සටහන.*-ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. විෂය නිර්දේශය :

(i). බුද්ධි පරීක්ෂණය :
මෙය අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්ක ශක්තිය, ගණිතමය හැකියාව, තර්කානුකූල තත්ත්වයන් හා තීරණ ගැනීමේ ශක්තීන් විනිශ්චය කිරීම සඳහා ය.

